# සීමා නිර්ණ ගැටලු නැති පළාත් පාලන ආයතනවල මැතිවරණය පවත්වන්න

## - පැෆරල් සංවිධානය ඉල්ලයි

රැහිල් ධර්මසේන දිවයින

සීමා නිර්ණ ගැටලු නැති පළාත් පාලන ආයතන ගැසට් පත්‍රයේ පළ කර වහාම ඒවායේ මැතිවරණ පැවැත්වීමට කටයුතු කරන ලෙස පැෆරල් සංවිධානය පළාත් සභා හා පළාත් පාලන ඇමැතිවරයාගෙන් ඉල්ලා සිටියි. යම් යම් කරුණු පදනම් කරගෙන දිගින් දිගටම මැතිවරණය කල් දැමීම කිසිසේත්ම සාධාරණ හෝ යෝග්‍ය නොවන බවද එම සංවිධානය ඇමැතිවරයාට ලිඛිතව දැනුම් දී ඇත.

මඩකලපුව පළාත් පාලන ආයතන 9 ක් 2011 වසරේ සිටත් වව්නියාව නගර සභාව 2012 සිටත් යාපනය මහ නගර සභාව 2013 වසරේ සිටත් පුදුකුඩිඉරිප්පු හා මුහුදු බඩපත්තු ප්‍රාදේශීය සභා 2012 වසරේ සිටත් සෙසු පළාත් පාලන ආයතන 250 කට වැඩි ප්‍රමාණයක් 2015 වසරේ සිටත් නිල කාලය අවසන්ව මැතිවරණ පවත්වා නොමැත.

සීමා නිර්ණය ගැටලු පිළිබඳව සොයා බැලීමට පත් කළ කමිටුව ඉකුත් දෙසැම්බර් මස 11 වැනිදා දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහනකදී ප්‍රකාශ කරනු ලැබුයේ ලැබී ඇති පැමිණිලි සියල්ල ඉකුත් ජනවාරි මාසය තුළ අවසන් කළ හැකි බව යැයි ද එම සංවිධානය පවසයි.

එහෙත් එය ඉන්පසු මාර්තු 31 දක්වාත් යළිත් අගෝස්තු 31 දක්වාත් කල් දමා ඇති බවද එය කිසිසේත්ම ප්‍රජාතන්ත්‍රවාදයට නුසුදුසු බවද පෙන්වා දී ඇත.

මේ නිසා පළාත් පාලන ආයතන 336 න් ආයතන කීයකට පැමිණිලි ලැබී ඇත්ද? කිසිදු පැමිණිල්ලක් නැති ආයතන කොපමණද? කඩිනමින් විසඳිය හැකි ගැටලු ඇති ආයතන කොපමණද? කාලයක් ගතවන ආයතන කොපමණද? යන්න සලකා බලා කඩිනමින් ප්‍රශ්න විසඳිය හැකි ආයතනවල ගැටලු කඩිනමින් විසඳා හැකි ඉක්මනින් ගැසට් කර ඒවාහි මැතිවරණ පවත්වන ලෙස පැෆරල් සංවිධානය ඉල්ලා ඇත.